**සජිත් ප්‍රේමදාස (පා.ම.)**
විපක්ෂ නායක - ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
**சஜித் பிரேமதாச (பா.உ.)**
எதிர்க்கட்சித் தலைவர் - இலங்கை பாராளுமன்றம்
**Sajith Premadasa (M.P.)**
Leader of the Opposition - Parliament of Sri Lanka

2023.07.31

මාධ්‍ය නිවේදනය.

පීදෙමින් තිබෙන ගොයමට ජලය ඉල්ලා ඇඹිලිපිටියේ ගොවීන් ආරම්භ කළ සත්‍යග්‍රහය තවදුරටත් ක්‍රියාත්මක වෙමින් තිබෙන නමුත්, දුර්ධාන්ත ආණ්ඩුවේ බලධාරීන්ට ඒ පිලිබඳව කිසිදු සහකම්පනයක් නැත.

අක්කර 75000 ක පමණ වගාබිම් ප්‍රමාණයකට ජලය සැපයීමට රජය තවමත් අපොහොසත් වී ඇති අතර, ඒ අතරින් අක්කර 65,000 ක් පමණම ඇත්තේ වී වගාවයි. පවතින ජල ගැටලුව හේතුවෙන් ඉදිරි සතිය තුළ වී වගාවෙන් රුපියල් බිලියන 16.81ක පමණ පාඩුවක් සිදුවිය හැකි බවට පුරෝකතනය කොට තිබේ.

ආණ්ඩුව සීත කාමරවල සිට ගනු ලබන අන්තනෝමතික තීන්දු හේතුකොටගෙන බරපතළ ව්‍යසනයක් සිදුවීම වැළැක්විය නොහැකි අතර, අප ආණ්ඩුවට සිහිපත් කරන්නේ පොහොර තහනම් කොට ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා ගනු ලැබූ අන්තනෝමතික තීන්දුවේ ප්‍රතිඵල සිහියට ගන්නා ලෙසය.

රටම බරපතළ අර්බුදකාරී තත්ත්වයක සිටින මොහොතක මුළු රටටම බත සපයන ගොවි ජනතාවගේ ජීවිත සමග සෙල්ලම් කිරීමෙහි ආදීනව ආණ්ඩුවට මෙන්ම මුළු රටටම අත් විඳින්න ට සිදුවනු ඇති අතර මෙය ආණ්ඩුව විසින් රටේ කෘෂිකර්මාන්තය අඩපන කිරීමට ගනු ලබන සූක්ෂම සහ කපටි උත්සාහයක ප්‍රතිඵලයක් දැයි සැක සිතෙයි.

තවදුරටත් ගොවි ජනතාව රවටන ප්‍රයෝග නොයොදා ඔවුන්ගේ වගා කටයුතු සඳහා අවශ්‍ය ජලය මුදා හරින ලෙස අප ආණ්ඩුවට බලකර සිටිමු.

ආණ්ඩුව සැමවිටම සිදුකරමින් සිටින්නේ ජනතාවාදී කටයුතු නොව,ජනතා විරෝධී කටයුතුය.එහි ප්‍රතිඵල ආණ්ඩුවට පාරා වළල්ලක් වන දිනය වැඩි ඈතක නොවන බව ද අවධාරණය කළ යුතුය.

**සජිත් ප්‍රේමදාස,**
විපක්ෂ නායක.

දුරකතන : தொலைபேசி: Telephone : 011 2 777 253 / 011 2 699 171
ෆැක්ස් : தொலைநகல்: Fax : 011 2 699 174
විද්‍යුත් තැපැල : மின்னஞ்சல்: Email : sajith_p@dialogsl.net

අංක 30, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 7
இலக்கம் 30, சர் மார்கஸ் பெர்னாண்டோ மாவத்தை கொழும்பு 7
No 30, Sir Marcus Fernando Mawatha Colombo 7